# 3 ශුභාරංචි හතර

ශුද්ධ බයිබලයේ නව ගිවිසුමේ ඇතුළත් ග්‍රන්ථ 27න් පළමු ග්‍රන්ථ හතර "ශුභාරංචි" යනුවෙන් හැඳින්වේ. ඒවා ලියන ලද කතුවරුන්ගේ නමින් ඒවා හඳුන්වනු ලබයි. ක්‍රිස්තුන් වහන්සේගේ උපත, සේවය, ඉගැන්වීම්, උකුත්වීම හා උත්ථානය ආශ්‍රයෙන් මෙම ග්‍රන්ථ ලියවී ඇත. ඒවා ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳ කරුණු ඇතුළත් ප්‍රධාන මූලාශ්‍ර හතරක් ලෙස පිළිගැනේ. ඒවා නම්;

1. ශු. මතෙව් තුමා විසින් ලියන ලද මතෙව් ශුභාරංචිය
2. ශු. මාක් තුමා විසින් ලියන ලද මාක් ශුභාරංචිය
3. ශු. ලූක් තුමා විසින් ලියන ලද ලූක් ශුභාරංචිය
4. ශු. ජොහන් තුමා විසින් ලියන ලද ජොහන් ශුභාරංචිය

## 1. මතෙව් ශුභාරංචිය



3.1 රූපය - ශු. මතෙව් තුමා




3.2 රූපය - සංකේතය මිනිසා

ශු. මතෙව් තුමා ජේසුස් වහන්සේගේ අපෝස්තුලුවරු දොළොස්දෙනාගෙන් කෙනෙකි. කැඳවීමට පෙර එතුමා අය බදු එකතු කළ අයකැමියෙකි. තම කැඳවීමෙන් පසු ජේසුස් වහන්සේගේ ප්‍රසිද්ධ ජීවිතයේ කොටස්කරුවකු වී ඔවුන් වහන්සේ ව අත්දුටුවේ ය. දිවැස්වැකි බහුල ව ඇතුළත් කර, බලාපොරොත්තු වූ "මෙසියස් වහන්සේ" ක්‍රිස්තුන් වහන්සේ බව පෙන්වා දී ඇත. ජේසුස් වහන්සේගේ වංශාවලියෙන් ශුභාරංචිය ආරම්භ කර ඇත. මෙම ශුභාරංචියේ සංකේතය, 'මිනිසා' ය.

## 2. මාක් ශුභාරංචිය




3.3 රූපය - ශු. මාක් තුමා



3.4 රූපය - සංකේතය සිංහයා

ශු. මාක් තුමා ජේසුස් වහන්සේගේ අපෝස්තුලුවරයෙක් නොවේ. එතුමා ශු. පේදුරු තුමාගේ ගෝලයෙකි. ජොහන් මාක් යනුවෙන් ද හඳුන්වනු ලැබූ මෙතුමා, පේදුරුතුමාගේ භාෂා පරිවර්තකයා ලෙස ද කටයුතු කර ඇත. එම නිසා ජේසුස්  වහන්සේ පිළිබඳ බොහෝ තොරතුරු පේදුරු තුමාගෙන් දැනගන්නට ඇතැයි සිතිය හැකි ය. ස්නාවක ජොහන් තුමාගේ දේශනය පිළිබඳ විස්තරයෙන් ආරම්භ කර ඇත. මෙම ශුභාරංචියේ සංකේතය වන්නේ 'සිංහයා' ය

## 3. ලූක් ශුභාරංචිය



3.5 රූපය - ශු. ලූක් තුමා



3.6 රූපය - සංකේතය ගවයා

ශු.  ලූක් තුමා ක්‍රිස්තුන් වහන්සේගේ අපෝස්තුලුවරයෙක් නොවේ. එතුමා වෛද්‍යවරයෙකි; ඉතිහාසඥයෙකි; චිත්‍ර ශිල්පියෙකි. ශුභාරංචියක් ලියන ලද

එක ම “අන්‍යජාතිකයා” ලූක් තුමා ය. එතුමා පාවුලු තුමා සමග ධර්මදූත සේවයේ නියැලී ඇත. විවිධ මුලාශ්‍රවලින් තොරතුරු සොයා, මෙම ශුභාරංචිය සම්පාදනය කර ඇත. ගීතිකා, යාච්ඤා හා කාන්තාවන් පිළිබඳ තොරතුරු ද වැඩිපුර මෙහි ඇතුළත් කර ඇත.

ජුද ජාතිකයන්ගේ පමණක් නොව සියලු ජාතීන්ගේ ගැලැවුම්කරුවා, ක්‍රිස්තුන් වහන්සේ බව මෙමගින් පෙන්වා දෙයි. සකරියස් තුමාගේ පූජාවෙන් ශුභාරංචිය ආරම්භ කර ඇති බැවින් මෙම ශුභාරංචියේ සංකේතය වන්නේ, ‘ගවයා’ ය.

## 4. ජොහන් ශුභාරංචිය



3.7 රූපය - ශු. ජොහන් තුමා



3.8 රූපය - සංකේතය රාජාලියා

ශු. ජොහන් තුමා ජේසුස් වහන්සේගේ අපෝස්තුලුවරයෙකි. එතුමාගේ සහෝදරයා වූ මහා ජාකොබ් තුමා ද ජේසුස් වහන්සේගේ අපෝස්තුලුවරයෙකි. මේ දෙදෙනා ක්‍රිස්තුන් වහන්සේ කැඳවීමට පෙර ධීවරයෝ වූහ. සෙබදි හා සලෝමි ඔවුන්ගේ දෙමාපියෝ ය. මරිය තුමී සලෝමිගේ ඥාතිවරයෙකි. එබැවින් මේ දෙදෙනා ජේසුස් වහන්සේගේ ඥාති සහෝදරයෝ වූහ. තේරුම් ගැනීමට අපහසු සංකල්පනාවකින් මෙය ආරම්භ කර ඇති නිසා, මෙම ශුභාරංචියේ සංකේතය ‘රාජාලියා’ ය.

ක්‍රිස්තුන් වහන්සේ මෙලොවට පැමිණීම ශුභාරංචියකි. මන්ද, ඔවුන් වහන්සේ මෙලොවට සපැමිණියේ, මනුෂ්‍ය සංහතියට ගැලැවීම ලබා දීම පිණිස ය.

## ක්‍රියාකාරකම්

(1) හිස්තැන් පුරවන්න.

(මාක් තුමා, ලූක් තුමා, මතෙව්, ගවයා, සිංහයා, ජොහන්, ජාකොබ් තුමා)

1. ශු ............... තුමා වෛද්‍යවරයෙකි.
2. ජේසුස් වහන්සේගේ අපෝස්තුලුවරයෙක් වූ ............. තුමාගේ ශුභාරංචිය නව ගිවිසුමේ මුලින් ම ඇත.
3. මාක් ශුභාරංචියේ සංකේතය වන්නේ ............... ය.
4. රාජාලියකුගෙන් සංකේතවත් කරන්නේ ............................... ශුභාරංචිය යි.
5. සුවිශේෂක ජොහන් තුමා ..................... ගේ සහෝදරයෙකි.

(2) පහත අවස්ථාවල දී ඔබ අන්‍යයන්ට ශුභාරංචියක් වන අයුරු ලියන්න.

i. පංතියේ දුකට පත් අසරණ මිතුරකුට/මිතුරියකට

ii. විද්‍යාව පාඩම අමාරු මිතුරකුට/මිතුරියකට

iii. ඔබේ පියා විදේශගත වී ඇති විට මවට හා සහෝදර සහෝදරියන්ට

## පැවරුම්

- ශු. බයිබලය ගෙන, ශුභාරංචි හතර පෙරළා, ඒවායෙහි හැඳින්වීම් කියවා, එහි ඇතුළත් කරුණු අඩංගු පොත් පිංචක් සකස් කරන්න.



**ජීවිතයට බිඳක්**

*සැම විට ම අන් අයට ශුභාරංචියක් වන්න උත්සාහ කරන්න.*